KEY FACT DOCUMENT

අමානා ළමා කාලීන ආයෝජනය

සුදුසුකම්	• අවම වශයෙන් රු. 50,000/- ක මූලික තැන්පතුවක් • සෑම අමානා ළමා ගිණුම් හිමියෙකුම වයස අවුරුදු 17 යන උපරිම වයස් සීමාවට යටත් වේ. • වලංගු ස්ථාවර නියෝගයක් සහිත අමානා ළමා ඉතුරුම් ගිණුමක් තිබිය යුතුය.
සේවාවෙහි ස්වභාවය	අමානා ළමා කාලීන ආයෝජනය හෙවත් Amana Kids Term Investment යනු අමානා බැංකුව විසින් දරුවන්ගේ යහපත වෙනුවෙන්ම හඳුන්වා දී ඇති සුවිශේෂී සේවාවකි. එකවර ඉහළ වටිනාකමකින් යුත් ආයෝජනයක් සිදුකරමින් දරුවන්ගේ අනාගතය සුරක්ෂිත කිරීමට කැමති දෙමාපියන් වෙනුවෙන් මෙය සැලසුම් කර ඇත. මෙමඟින් දෙමාපියන්ට හෝ භාරකරුවන්ට අනාගතයේදී ඉහළ ප්‍රතිලාභ ලැබෙන බවට විශ්වාසයකින් යුතුව දරුවන් වෙනුවෙන් ආයෝජනය කිරීමට අවස්ථාව හිමි වේ. එමෙන්ම අපගේ Flexi Term Investment ගිණුම මෙන්ම මෙයටද අවශ්‍ය ඕනෑම අවස්ථාවක මුදල් බැරකිරීමට අවස්ථාව ලබා දී ඇත.
මූලික ලක්ෂණ	• ඕනෑම වේලාවක බැංකු ශාඛාවක් වෙත පැමිණීමෙන්, මුදල් තැන්පත් කිරීමේ යන්ත්‍ර මඟින්, ගිණුමකින් ගිණුමකට මුදල් මාරු කිරීම මඟින් හෝ විදේශ රටක සිට මුදල් බැර කිරීම (ප්‍රේෂණ) මඟින් ගිණුමට අමතර මුදල් බැර කළ හැක. • වඩාත් ඉහළ ලාභ බෙදාදීමේ අනුපාතයක් • මාස්පතා උපයාගනු ලබන ලාභය නැවත ආයෝජනය කිරීමේ හෝ ළමා ඉතුරුම් ගිණුම වෙත මාරු කිරීමේ හැකියාව • කාලීන ආයෝජනය කල්පිරෙනුයේ දරුවාට අවුරුදු 18 පිරුණු පසුව පමණි.
අවශ්‍ය ලිපිලේඛන	• මව, පියා හෝ භාරකරුගේ ජාතික හැඳුනුම්පත, විදේශ ගමන් බලපත්‍රය හෝ රියදුරු බලපත්‍රය • දරුවාගේ උප්පැන්න සහතිකය • ළමා ගිණුමට ස්ථාවර නියෝගයක් ලබා දී ඇති බවට සාක්ෂි • අයදුම්පත ළඟම පිහිටි අමානා බැංකු ශාඛාව වෙතින් ලබාගන්න. නැතිනම් මෙම වෙබ් ලිපිනය තුළින් බාගත

	කරගන්න: https://www.amanabank.lk/application-downloads.html
ගාස්තු	දැනට ක්‍රියාත්මක වන ගාස්තු අපගේ නිල වෙබ් අඩවියෙහි දක්වා තිබේ: https://www.amanabank.lk/tariff-services.html
නියමයන් හා කොන්දේසි	සේවාවන් සම්බන්ධ තොරතුරු සහ නියමයන් හා කොන්දේසි කලින් කලට වෙනස් වීමට ඉඩ ඇත. එම නිසා නවතම තොරතුරු සහ නියමයන් හා කොන්දේසි දැනගැනීම සඳහා ළඟම පිහිටි අමානා බැංකු ශාඛාව වෙත යන්න. නැතිනම් අපගේ නිල වෙබ් අඩවියට පිවිසෙන්න. https://www.amanabank.lk/pdf/application-downloads/general-business-conditions.pdf
රක්ෂණ ආවරණය	අමානා බැංකුව ශ්‍රී ලංකා මහ බැංකුව මඟින් ක්‍රියාත්මක කරනු ලබන ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමයේ සාමාජික බැංකුවකි. එමඟින් එක් තැන්පත්කරුවෙකුගේ නිසි සුදුසුකම් සපුරන තැන්පතු සඳහා රු. මිලියන 1.1 ක් දක්වා ආවරණයක් හිමි වේ.
ප්‍රතිචාර සහ පැමිණිලි	ඔබගේ ප්‍රතිචාර සහ පැමිණිලි පැය 24 පුරා ක්‍රියාත්මක අපගේ පාරිභෝගික විසඳුම් මධ්‍යස්ථානය වෙත යොමුකරන්න. අපගේ නියෝජිතයන් ඔබට අවශ්‍ය සහයෝගය නොපමාව ලබාදෙනු ඇත. පාරිභෝගික විසඳුම් මධ්‍යස්ථානයේ දුරකථන අංකය: +94 11 7 756 756 ඊමේල් : info@amana.lk | feedback@amana.lk ඔබගේ විමසීම් අපගේ වෙබ් අඩවිය හරහා යොමුකරන්න: www.amanabank.lk කෙසේ නමුත් ඔබගේ අවශ්‍යතාව ඉටු නොවූයේ නම් ඒ බව ලිපියක් හෝ විද්‍යුත් ලිපියක් (ඊමේල්) මඟින් අප වෙත දැනුම් දෙන්න: කළමනාකරු - සේවා තත්ත්ව සහතිකකරණ

	අමානා බැංකුව අංක 485, ගාලු පාර, කොළඹ 03 ඊමේල්: servicequality@amana.lk
	ඉහත සඳහන් ක්‍රම මගින් ඔබගේ අවශ්‍යතාව ඉටු නොවූයේ නම්, ඔබට ස්වාධීන මූල්‍ය ඔම්බුඩ්ස්මන්වරයාගේ සේවාව ලබාගත හැක. මූල්‍ය ඔම්බුඩ්ස්මන් කාර්යාලයේ සම්බන්ධතා තොරතුරු පහත දැක්වේ. මූල්‍ය ඔම්බුඩ්ස්මන්, අංක 01, බෙතෙස්ඩා පෙදෙස, මිලාගිරිය, කොළඹ 04 දුරකථන: + 94 11 2595624 ෆැක්ස්: +94 11 2595625

Feedback and Complaints	You can get in touch with our Customer Solutions Centre 24x7 to share your feedback and address your grievances, for which our team would ensure desired attention to help resolve your concerns. Customer Solution Centre Number :+94 11 7 756 756 Email : info@amana.lk | feedback@amana.lk Submit your inquiry on our website www.amanabank.lk However, if your expectations have not been met with, you can write or e- mail to: The Manager - Service Quality Assurance Amana Bank, No. 486, Galle Road, Colombo 03 or e-mail servicequality@amana.lk
	If your expectations haven't still been met with, the services of an independent Financial Ombudsman are made available for you. You may contact the office of the Financial Ombudsman as follows. Financial Ombudsman, No.1, Bethesda Place, Milagiriya, Colombo 04. Telephone: + 94 11 2595624 Fax: +94 11 2595625